## 1.27 සිංහල ජාතකකතා සාහිත්‍යයෙහි ශක්‍ර භූමිකාව

ඩබ්.එස්. උපුල් වසන්ත
නො 153/ඒ, කොරටුවෙල, හුංගම.

## ABSTRACT

අනුභූතියෙහි තාර්කික සන්දර්භය අද්භූත බවට පත්කරමින් ථේරවාදී ආස්ථානය උදෙසා සිංහල ජාතකකතා සාහිත්‍යයෙහි ශක්‍ර භූමිකා ගොඩ නගා තිබෙන අවස්ථා බහුලව හඳුනාගැනීමට හැකිය. ශ්‍රී තාරානාත තර්කවාචස්පතීන්ගේ ශබ්දස්තෝම මහානිදියෙහි ශක්‍ර ශබ්දයට සපයා තිබෙන අර්ථය ඉන්ද්‍ර (386 පිට,1814 කල්කටා) වන අතර ඉන්ද්‍රයන්ට දේවාදිපතේ, පරමේශ්වරේ, ඉන්ද්‍රදෛවතේ (68 පිට෴ 1814 කල්කටා) යන අරුත් දක්වේ. මෝර්නියර් විලියම්ස් ගේ ශබ්ද කෝෂයේදී (Sanskrit-English Dictionary) ශක්‍ර යන වචනයට Strong, powerful, Mighty (Applied to various gods) (P.1045) යනුවෙන් සඳහන් වේ. ආර්.එල්.ටර්නර්ගේ Comparative dictionary of the Indo-Aryan Languages ශබ්දකෝෂයේ ද ශක්‍ර ශබ්දයට Mighty, The god ingra... Name of a god (P.710) යනුවෙන් සඳහන් වේ. වැලිවිට පණ්ඩිත සෝරත ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ශ්‍රී සුමංගල ශබ්ද කෝෂයේ ශක්‍ර වචනයට දෙව් රජ (987 පිට) යන අරුත සපයා ඇත. මේ අනුව පැහැදිළි වන්නේ පෙරදිග සාහිත්‍යයෙහි ශක්‍ර භූමිකාව දිව්‍ය රාජභූමිකාවක පවතින බව යි. පෙරදිග සාහිත්‍යයෙහි විවිධ මූලාශ්‍ර ආශ්‍රයෙන් ඉන්ද්‍ර, සහස්‍රනයන, ශක්‍ර, පුරින්දද, මාඝවා, පුරන්දර, වාසව, සුජම්පති, කෝසිය, කෞෂික, සහස්සක්ඛ ආදී විවිධ නම් ඔස්සේ ශක්‍ර භූමිකාව ඉදිරිපත්ව ඇති බව පැහැදිළි ය.

සංස්කෘත මූලාශ්‍රවල ශක්‍ර චරිතය කෙරෙහි දක්වන අවධානයට වඩා වෙනස් මුහුණුවරකින් ථේරවාදී සාහිත්‍යයෙහි ශක්‍ර භූමිකා ගොඩ නගන බව පෙනේ. සංයුක්ත නිකායේ (දෙවන) දේවා (සත්තවනපද) සූත්‍රයෙහි ශක්‍ර භූමිකාව සඳහා යහ අරුත් සපයයි. පෙර මාඝ නම් මානවක වූ බැවින් මාඝවන්තු වූ බවත් පළමු පළමු දන් දුන් බැවින් පුරින්දද වූ බවත් සකස්කොට දන් දුන් බැවින් සක්ක වූ බවත් ආවාස දුන් බැවින් වාසව වූ බවත් අරුත් දහසක් මොහොතින් දැකීමටත් සිතීමටත් හැකි බැවින් සහස්වක්ඛ වූ බවත් සුජානම් අසුර දේවියගේ සැමියා වූ බැවින් සුජම්පති වූ බවත් තවුතිසා දෙව්පුර රජ වූ බැවින් දේවානමින්ද වූ බවත් සඳහන් කරයි. මේ අයුරින් ථේරවාදී සාහිත්‍යයේ ප්‍රගතිශීලී මුහුණුවරකින් ශක්‍රයා නිරූපණය කරන අතර සිංහල ජාතක පොතෙහි බෝධිසත්ව චරිතයේ පැවැත්ම උදෙසා ශක්‍ර භූමිකාව දේවත්වයෙන් ඉදිරිපත් කරයි.

සිංහල ජාතක කථා සාහිත්‍යයෙහි ශක්‍ර භූමිකාවට වඩා විශේෂ අවධානයක් දක්වන්නේ බෝසත් චරිතය කෙරෙහිය. ජාතක කථා සාහිත්‍යය පිළිබඳව ඉදිරිපත්කොට තිබෙන බොහෝ විමර්ශනවලදී ජාතක කථා යනු ආගමික සාහිත්‍යයක් යැයි සලකා බෝසත් චරිතයම එහි පිළිබිඹුවන ආකාරය විමසයි. එහෙත් ජාතක කථාවල තාර්කික බව බිඳහෙළමින් ඉදිරිපත් කෙරන ශක්‍ර චරිතය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීම වැදගත් වේ. අද්‍යතන සමාජයට ජාතක කථාවල උපයෝගීතාවය විමර්ශනය කිරීමේදී බෝසත් චරිතයේ පරමාදර්ශය මෙන්ම ශක්‍ර චරිතයේ පරමාදර්ශය ද වැදගත් බව පෙනේ. ජාතක කථා බොහෝමයක ශක්‍රයා නොමැතිව බෝධිසත්ත්වයන්ට ජයග්‍රහනය කළ නොහැක. අද්‍යතන සමාජයේ ද බෝසතුන්ට වූ අභියෝග පැවතිය ද ශක්‍රයාගේ පැමිණීම ප්‍රායෝගික නැත. එසේම ජාතක කථා සාහිත්‍යකරුවා පවසන වැදගත් කරුණක් නම් පාඨකයා බෝසතුන් උදෙසා වන ප්‍රගතිශීලී ශක්‍ර භූමිකාවකට පැමිණිය යුතු බව යි. මේ අනුව ශක්‍ර භූමිකාවේ උපයෝගීතාවය අධ්‍යතන සමාජයට ඉතා වැදගත් පරමාදර්ශයකි.